**කුඩා තේ වතු හා රබර් වතු යළි නඟා සිටුවීමේ ව්‍යාපෘතිය - 2018**

--------------------------------------------------------------------------------

කුඩා තේ වතු හා රබර් වතු යළි නඟා සිටුවීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල අතර 2016 අප්‍රේල් 26 දින එළඹි අංක 2000001447 දරණ මූල්‍යයන ගිවිසුමේ XI ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

--------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘති ප්‍රදේශය තුළ කුඩා තේ වතු හා රබර් වතු හිමියන්ගේ වඩාත් ඵලදායී, ලාභදායී සහ ප්‍රකෘතිමත් බවට ආර්ථික කටයුතු සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො.මිලියන 65.40 කට සමාන රු.මිලියන 8,502.08 ක් වන අතර ඉන් එ.ජ.ඩො මිලියන 25.77 කට සමාන රු.මිලියන 3,349.30 ක් සැපයීමට කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල එකඟ වී තිබුණි. ඉතිරි රු.මිලියන 5,152.78 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අගෝස්තු 15 දින ආරම්භ කරන ලද අතර 2021 අප්‍රේල් 23 දිනට නිමකිරීමට අපේක්ෂිතය.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

---

## 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

---

කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීමේ අධිකාරියට හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීමට සහ මූල්‍ය ආයතන 04 ක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ණය වැඩසටහන් මගින් මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා සංරචක 03 කින් ව්‍යාපෘතිය සමන්විත විය. ගාල්ල, මාතර, රත්නපුර, බදුල්ල, නුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල නැවත වගා කිරීමේ අරමුණු සඳහා සහ අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කවල කුඩා රබර් වතු හිමියන්ට නව වගා අරමුණු සඳහා සහයෝගය ලබා

දීම සඳහා සහනාධාර ක්‍රම ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කෙරේ. ව්‍යාපෘති කටයුතුවල ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ඉහත සඳහන් දිස්ත්‍රික්ක 05, හෙක්ටයාර 3,875ක තේ නැවත වගාකිරීම සඳහා 2018 දෙසැම්බර් 31 දින දක්වා කුඩා තේ වතු හිමියන්ට බලපත්‍ර නිකුත් කිරීමට සැලැසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ඉඩම් අක්කර 2,382ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබු අතර ඒ මත කුඩා තේ වතු හිමියන්ට එකතුව රු.මිලියන 348ක පෙර ගෙවීම් සිදුකර තිබුණි. ලැබී ඇති තොරතුරුවලට අනුව, 2018 දෙසැම්බර් 31 දින වන විට තේ ඉඩම් අක්කර 738ක් පමණක් නැවත වගාව සඳහා සකස් කර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර නොගනී. | නොවැලැක්විය හැකි තත්ත්වයන් මත 2016, 2017 සහ 2018 වර්ෂවලදී ව්‍යාපෘතියට අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවිය නොහැකි වී තිබුණි. නැවත සිටුවීමේ වැඩසටහන වේගවත් කිරීම සඳහා, අතින් ඉඩම් මැනීමේ පිළිවෙත් වෙනුවට ජීපීඑස් තාක්ෂණයෙන් තේ පරීක්ෂකවරුන්ට මෙම ව්‍යාපෘතිය මගින් බලය ලබා දී ඇත. | රේඛීය අමාත්‍යාංශය සහ කුඩා වතුහිමියන් සංවර්ධන අධිකාරිය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. |
| (ආ) | වෙනත් තේවතු හිමියන් 109 දෙනෙකු විසින් මහනුවර දිස්ත්‍රික්කයේ ඉඩම් අක්කර 23.85ක නැවත් තේ වගා කිරීම සඳහා බලපත්‍ර සහ පෙර ගෙවීම් රු. මිලියන 3.58ක් ලබාගෙන තිබු නමුත්, ඔවුන් විසින් වගාකටයුතු අඛන්ඩව කරගෙන ගොස් නොතිබූ බව නිරීක්ෂණය විය. | අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කරගෙන නොතිබුණි. | පිළිගනිමි. සහනාධාර ගෙවීම වේගවත් කිරීම සඳහා දිස්ත්‍රික් ව්‍යාපෘති කළමනාකරණ ඒකක විසින් බිඳ වැටීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් ගැනීම වෙනුවෙන් ව්‍යාපෘති කාර්යයන් අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ලැබී ඇති තොරතුරුවලට අනුව, මහනුවර දිස්ත්‍රික්කයේ තේ කුඩා හිමියන් **331** දෙනෙකුට හෙක්ටයාර් **47.23** ක තේ නැවත වගා කිරීම සඳහා ඉඩම් සැකසීමේ කටයුතු අවසන් වී තිබියදීත්, දෙවන හා තෙවන වාරික සහනාධාර තේ පරීක්ෂකවරුන්ගේ නිර්දේශ ලැබීමට ප්‍රමාද වීම හේතුවෙන් ලබා ගැනීමට නොහැකි විය. | සහනාධාර ගෙවීමේ ප්‍රමාදයන්. | සහනාධාරයේ වාරික නිදහස් කිරීම සඳහා බිඳ වැටීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ | ව්‍යාපෘති කටයුතු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවිය යුතුය |
| (ඈ) | මෙම ව්‍යාපෘතිය යටතේ රබර් පැල නැවත සිටුවීමේ කටයුතු සඳහා සකස් කරන ලද මහා ඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වරාපිටිය ප්‍රදේශයේ හෙක්ටයාර් **17.81** ක භූමි ප්‍රමාණයක් ජලාශයක් ඉදි කිරීම සඳහා මිලදීගෙන තිබූ බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එබැවින් කුඩා වතු හිමියන් **22** දෙනෙකුට ලබා දුන් පෙර ගෙවීම් රු. මිලියන **1.25** ක් නිෂ්ඵල වියදමක් විය. තවද, මහ ඔය සහ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කුඩා වතු හිමියන් 65 දෙනෙකු විසින් සිදුකරන ලද හෙක්ටයාර 41.29 ක රබර් වගාව වන අලි විසින් විනාශ කර ඇති අතර 2016 සහ 2017 වර්ෂවලදී සිදුකළ එකතුව රු. මිලියන 2.89 ක පෙර ගෙවීම් නිෂ්ඵල වියදමක් බවට පත්ව ඇත. මීට අමතරව, දමන සහ ලාහුගල හි තවත් කුඩා වතු හිමියන් 12 දෙනෙකු විසින් | අපේක්ෂිත පරමාර්ථය සාක්ෂාත් කරගත නොහැකි විය | පිළිගනිමි. අලාභය අවම කිරීම සඳහා පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පෙර ගෙවීම් නිදහස් කිරීමට පෙර පාරිසරික කරුණු සලකා බැලීම අවශ්‍ය වේ. තවද, පාඩු අවම කිරීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සිදුකරන ලද හෙක්ටයාර් 10.54 ක රබර් වගාව ද එම ප්‍රදේශයේ පැවැති දරුණු නියඟය නිසා විනාශ වී තිබුණි. | | | |
| (ඉ) | මෙම ව්‍යාපෘතිය මගින් ව්‍යාපෘති ප්‍රදේශවල ජීවත්වන ප්‍රතිලාභීන්ගේ සමාජ හා ආර්ථික පසුබිම පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා රු. මිලියන 6.5 ක පිරිවැයකට 2018 ඔක්තෝබර් 31 දින මූලික සමීක්ෂණයක් සහ අධීක්ෂණ හා ඇගයීම් පද්ධතියක් අවසන් කර තිබුණි.<br>කෙසේවෙතත්, පවත්වන ලද සමීක්ෂණය මත පදනම්ව ව්‍යාපෘතියේ අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සඳහා ඇගයීම් හා අධීක්ෂණ නිලධාරීන් ව්‍යාපෘතිය විසින් බඳවා ගෙන නොතිබුණි. | සමීක්ෂණ තොරතුරු පාර්ශවකරුවන් ගේ ප්රතිලාභ සඳහා ඵලදායී ලෙස භාවිතා කළ නොහැක. | ඇගයීම සහ අධීක්ෂණ අරමුණු සඳහා යෝග්‍ය සුදුසුකම්ලත් පුද්ගලයින් තෝරා ගැනීමට උත්සාහ කරනු ලැබේ. | මූලික සමීක්ෂණයේ පිරිවැය සලකා බැලීමේදී, විශේෂ පුද්ගලයෙකුගෙන් සේවා ලබා ගැනීමෙන් සමීක්ෂණ තොරතුරු ඵලදායී ලෙස ලබාගත හැකිවේ. |

## 2.2 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයෙ |
|---|---|---|---|
| 2018 වර්ෂය සඳහා වූ අයවැය ඇස්තමේන්තුව අනුව, රු. මිලියන 500ක දේශීය සංරචකයන් සහ රු. මිලියන 900ක විදේශීය සංරචකයන් යටතේ ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ 2018 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන **321**ක දේශීය සංරචකයන් සහ රු. මිලියන 825.91 ක විදේශීය සංරචකයන් යටතේ පමණක් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘතිය සැලැසුම් කර තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. මිලියන 163.24 ක දේශීය සංරචකයන් සහ රු. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ප්‍රතිපාදන උපයෝජනයෙන් අපේක්ෂිත ඉලක්ක ළඟාකරගෙන නොහැකි වී තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොමැත. | ව්‍යාපෘතිය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන උපයෝගී කර ගැනීම සඳහාත්, රටේ කුඩා වතු හිමියන්ගේ වතු නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහාත් ක්‍රියාකාරී සැලැස්ම පිළිපැදීමට කඩිනම් පියවර ගත යුතුය. |

මිලියන 713.59 ක විදේශීය සංරචකයන් උපයෝජනය කර තිබුණි.

## 2.3 මූලධන කාර්යයන්වල ප්‍රමාදවීම්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයෙ |
|---|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරිය, වන සත්ත්ව සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ පුරා විද්‍යා දෙපාර්තමේන්තුව වැනි අධිකාරින්වල පූර්ව අනුමැතීන් ලැබී නොතිබීම හේතුවෙන් රු. මිලියන 18ක පිරිවැයක් මත පවත්වාගෙන ගිය අම්පාර රබර් පැල තවානේ සංවර්ධන කාර්යයන් 2018 දෙසැම්බර 31 දින වන විට අතහැර දමා තිබුණි. මේ හේතුවෙන් ඉහත දිස්ත්‍රික්ක දෙකෙහි ව්‍යාපෘතිය මගින් රබර් පැල 250,000ක් වාර්ෂිකව වගා කිරීමේ ඉලක්කය සැකසහිත විය. | සැලසුම් කළ කාර්යයන් ක්‍රියාත්මක කර නොතිබුණි. | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් සංවර්ධන කාර්යයන් සිදු කර තිබූ අතර අදාල කර්තව්‍යයන් නැවත ආරම්භ කර 2019 ඔක්තෝබර් මාසයට පෙර අවසන් කිරීමට කටයුතු කෙරේ. | ඉල්ලුමට සරිලන ආකාරයෙන් නිෂ්පාදනය ඉහළ නැංවීමට ඉක්මණින් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. |

## 2.4 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයෙ |
|---|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය මගින් මෝටර් රථ 10 ක් 2018 සැප්තැම්බර් 04 වන දින රු. මිලියන 85 කට මිලදී ගෙන තිබූ නමුත් රියදුරන් බඳවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් 2018 දෙසැම්බර් 31 දක්වා මාස 04 ක කාලයක් අක්‍රීයව පැවතුනි. ඉහත සඳහන් මාස 04ක කාලපරිච්ඡේදය සඳහා රු. මිලියන 2.64ක පිරිවැයකට වෑන් රථ කුලියට ගැනීමට කටයුතු කර ඇත. | මහජන මුදල් නාස්ති කිරීමකි. | ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා රියදුරන් බඳවා ගැනීම සඳහා ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ඇති නොවැළැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන් මෙම තත්ත්වය පැනනැගුනි. එමනිසා වාහන කුලියට ලබාගැනීමට කටයුතු කර තිබුණි. | තත්ත්වය නිවැරදි කිරීමට සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට කඩිනම් පියවර ගැනීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියට අයත් වාහනයක් **2018** මාර්තු මාසයේදී හදිසි අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි **104** හි නියම කර ඇති පරිදි අලාභය නිෂ්චය කිරීම සහ ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට පියවර ගෙන නොමැත. | අලාභ සඳහා අයකර ගැනීමේ වගකීම සහ අලාභ අය කර ගැනීමට නොහැකි වීම. | මේ සඳහා පත් කරන ලද කමිටුව විසින් මූලික පරීක්ෂණයක් පවත්වන ලද අතර එහි වාර්තාව පදනම්කර ගනිමින් වෙනත් කමිටුවක් පත් කර අවසන් විමර්ශනය කරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුව කල් ඇතිව පියවර ගත යුතුය. |